හඟුරන්කෙත ප්‍රාදේශීය සභාව
නුවරඑළිය දිස්ත්‍රික්කය
------------------------

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 21 දින ද විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 ජුනි 18 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට හඟුරන්කෙත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
----------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු
------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුදල් පොතේ ශේෂය රු.8,719,697 ක් වුවත් ශේෂ පත්‍රයේ එය රු.8,882,450 ක් ලෙස රු.162,753 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (ii) | ජ'නල් අංක 14 අනුව කසළ බදු ද්විත්ව ගණනය නිවැරදි කිරීමට අදාළ සටහන් ගිණුම්වලට ගලපා නොතිබීම හේතුවෙන් සමුච්චිත අරමුදල සහ හිඟ හිටි කසළ බදු රු.121,850 බැගින් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (iii) | පෙර වර්ෂයේ කර්මාන්ත ණයහිමියන්ට රු.100,000 ක මුදල් ගෙවීමේදී වරදවා ගිණුම් තැබීම හේතුවෙන් කර්මාන්ත ණය හිමියන් රු.200,000 ක් අඩුවෙන් හා වියදම් ණයහිමියන් රු.200,000 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

| | | | |
|---|---|---|---|
| (iv) | 2018 වර්ෂයේදි වැඩියෙන් බිල් කරන ලද රු.97,956 ක් නිවැරදි කිරිම සඳහා ජ'නල් සටහනක් ලියා තිබූ නමුත් අදාළ ද්විත්ව සටහන් ගිණුම් තුළ ගලපා නොතිබුණි. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (v) | ඉටු නොකළ ව්‍යාපෘති 43 කට අදාළව රු.2,150,000 ක් වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

(ආ) නොසැසඳුනු පාලන ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ලේඛන අනුව හිඟහිටි කසළ බදු අදායම රු.327,750 ක් වුවත් ගිණුම අනුව වටිනාකම රු.442,450 ක් වූයෙන් රු.114,700 ක වෙනසක් විය. | වෙනස හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | වසරක කාලයක් ඉක්මවා අයවීමට තිබූ ලැබිය යුතු කර්මාන්ත ණයගැති ශේෂය රු.100,000 ක් විය. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (ii) | වසරක කාලයක් ඉක්මවා ගෙවිය යුතුව පැවති ණයහිමි ශේෂය රු.1,801,217 ක් විය. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

(ඈ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වටිනාකම රු.12,260,318 ක් වූ ගිණුම් ශේෂ 07 කට අදාළව උපලේඛන, තැන්පතු ලේඛන සහ අත්තිකාරම් ලේඛන විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | මූලා ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කොන්ත්‍රාත්කරුවන්ගේ තැන්පතු ගිණුමේ රු. 304,690 ක හර ශේෂයක් පෙන්නුම් කළද එසේ වීමට හේතු පැහැදිලි නොකෙරුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

1.4 අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 218 | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | අදාළ රීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (ආ) | පළාත් පාලන කොමසාරිස්ගේ 1988 මැයි 17 දිනැති අංක 1988/22 දරන චක්‍රලේඛය | වරිපනම් බදු සඳහා දේපළ තක්සේරුව අවසන්වරට සිදුකර තිබුණේ 2013 වර්ෂයේදී ය. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,124,364ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,517,554 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 ඇස්තමේන්තුගත ආදායම | 2019 බිල්කළ ආදායම | 2019 රැස්කළ ආදායම | 2019 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2018 ඇස්තමේන්තුගත ආදායම | 2018 බිල්කළ ආදායම | 2018 රැස්කළ ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 3,009,900 | 3,362,314 | 1,461,841 | 1,900,473 | 2,653,600 | 2,867,853 | 1,170,580 | 2,281,153 |
| කුලී | 5,344,300 | 4,064,347 | 2,002,306 | 2,062,041 | 5,232,000 | 3,514,595 | 2,865,909 | 2,496,322 |
| බලපත්‍ර ගාස්තු | 2,785,000 | 1,982,480 | 1,982,840 | - | 2,638,000 | 2,222,141 | 2,222,141 | - |
| වෙනත් ආදායම් | 12,987,300 | 3,812,871 | 3,143,074 | 669,797 | 14,336,800 | 12,574,779 | 5,778,730 | 7,155,791 |
| | 24,126,500 | 13,222,012 | 8,590,061 | 4,632,311 | 24,860,400 | 21,179,368 | 12,037,360 | 11,933,266 |

### 2.2.2. ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| හඟුරන්කෙත පොදු වෙළඳපොළ සංකීර්ණයේ කඩ කාමර 12 කින් වසර 4 සිට 9 දක්වා කාලයක සිට පැවත එන රු.2,214,537 ක හිඟ කඩ කුලී අය කරගෙන නොතිබුණි. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| උසාවි දඩ රු.286,587 ක් හා ඉඩම් හුවමාරු කිරීමේ මුද්දර ගාස්තු රු.4,780,200 ක් අය විය යුතුව තිබුණි. | අදාළ මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

### 2.2.4 අධිභාර

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු අයවලුන්ට එරෙහිව ම විසින් ඉකුත් වර්ෂයන් තුළ පැනවූ අධිභාරවලින් 2019 දෙසැම්බර් | අයකර ගැනිමට කටයුතු කිරීම. | අදහස් දක්වා නොමැත. |

31 දිනට රු.57,512 ක මුදලක් අයකර ගැනීමට තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1 කාර්යසාධනය

----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කාර්තවයන් ඉටුකිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) ප්‍රසම්පාදන සැලැස්ම

----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී රු.2,634,297 ප්‍රසම්පාදන කටයුතු සිදුකර තිබුණු නමුත් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

(ආ) තිරසර සංවර්ධන ඉලක්ක

-----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක පිළිබඳව ප්‍රාදේශීය සභාව ප්‍රමාණවත්ව දැනුවත්වී නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂය තුලදී ඒ සම්බන්ධයෙන් නිශ්චිත කාර්යයන් ඉටුකර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන ඒ අනුව සැලසුම් සකස් කිරීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

3.2 මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තනතුරු 10 ක් සඳහා පුරප්පාඩු 16 ක් පැවතුණි. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කිරීම. | අදහස් දක්වා නොමැත. |

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

-----------------------------------------

අයවැය පාලනය

-------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ----------------------- | ------------ | ---------------------------- |
| 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 193 අනුව අයවැයගත ආදායම් වියදම් සහ සත්‍ය ආදායම් වියදම් අතර විචලනයට හේතු පැහැදිලි කරන ප්‍රකාශයක් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය හා පරිපාලන රීතී ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |